# ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
# ஆரம்பக் கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
# MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

මගේ අංකය : MPI&SE/NSPD/04/03
எனது இல :
My No. :

ඔබේ අංකය :
உமது இல :
Your No. :

දිනය : 2019.11. 21
திகதி :
Date :

අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 03/2019

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

<u>2019 අයවැය යෝජනා අනුව ආබාධ සහිත ප්‍රජාව සේවා නියුක්ති කිරීමේ අරමුණින් වැටුප් සහනාධාරයක් ලබා දීම</u>

ආබාධ සහිත ප්‍රජාව ජාතික ආර්ථිකයකට දායක කර ගැනීම මුලික කරගෙන පෞද්ගලික සේවා යෝජකයන් දිරි ගැන්වීම හා සේවා නියුක්තිය වර්ධනය කිරීමේ අරමුණින් මෙම වැටුප් සහනාධාරය ලබාදීම ක්‍රියාත්මක වේ. අතිගරු ජනාධිපතිතුමා විසින් 2019.02.22 දිනැතිව ඉදිරිපත් කරන ලද අංක PS/CP/61/2019 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව, ශ්‍රී ලංකාවාසී සියලු ම ආබාධ සහිත තැනැත්තන්ගේ සුදුසුකම්වලට ගැලපෙන පරිදි රැකියා සපයා දීමේ ව්‍යාපෘතියක් මෙම වසර තුළ දියත් කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව ආබාධ සහිත තැනැත්තන් සේවයේ යොදවා ගන්නේ නම් රු. 15,000/- ක උපරිමයකට යටත්ව සේවකයන්ගේ වැටුපෙන් 50% ක, වැටුප් සහනාධාරයක් මාස 24 ක් දක්වා රජය විසින් ලබාදීමට කටයුතු කරනු ලැබේ. මේ සඳහා පහත කොන්දේසි හා නියමයන් අදාළ වේ

**රැකියාගත කිරීමට ආබාධ සහිත තැනැත්තන් තෝරාගන්නා ක්‍රමවේදය**

1) දීර්ඝ කාලීනව කායික, මානසික, බුද්ධිමය හෝ හැඟීම් දැනීම් වල සංවේදනාත්මක සහිත භෞතික පරිසරයේ විවිධ වූ බාධාවන් නිසා දෛනික ක්‍රියාකාරිත්වය සීමා වූවන් ආබාධ සහිත පුද්ගලයන් ලෙස සලකනු ලබයි. මෙම සහනාධාරය ලබා ගැනීමට සුදුසුකම් ලබනුයේ ආබාධ සහිත තැනැත්තෙකුය. එය මාස 03ක් ඇතුලත ලබාගත් වෛද්‍ය සහතිකයක් මඟින් සනාථ කරගත යුතුය.

2) හදිසි අනතුරු හෝ ලෙඩ රෝග නිසා තාවකාලිකව ආබාධිතවන පුද්ගලයින් මෙම ආධාරය ලැබීමට සුදුසුකම් නොවේ.

3) වයස්ගතවීම හෝ රෝගී තත්වයන් නිසා ඇතිවන දූර්වලතාවයන් මෙම ආධාරය ලැබීමට සුදුසුකමක් නොවේ.

4) රැකියාගත වීමට අපේක්ෂාවෙන් හා කැමැත්තෙන් සිටින ආබාධ සහිත පුද්ගලයන්ට රැකියා ස්ථානයට වඩාත් පහසුවෙන් ලගාවිය හැකි, අවම දුෂ්කරතා සහිත ස්ථානයක් වීම යෝග්‍ය වේ.

5) වයස අවු. 18-55 අතර රැකියාවක නිරතවීමේ හැකියාව සහිත අයකු විය යුතුය.

තෝරාගන්නා ලද ආබාධ සහිත තැනැත්තන් රැකියාගත කරනු ලබන ක්‍රමවේදය

06. කැමැත්ත ප්‍රකාශිත රැකියා යෝජක ආයතනය වෙත තෝරාගන්නා ලද රැකියා අපේක්ෂිත ආබාධ සහිත තැනැත්තන් යොමු කරීමට අවශ්‍ය සම්බන්ධීකරණය සමාජසේවා නිලධාරි විසින් කල යුතු අතර, සම්මුඛ පරීක්ෂණ මගින් අදාළ තනතුරු වලට බඳවා ගැනීමට අවශ්‍ය මැදිහත් වීම කල යුතුය.

07. ආයතනය ස මඟ සාකච්ඡාකර ඔවු න්ගේ ආබාධිත බ වට අ දාළව සුදු සු රැකියාව කුමක්ද යන්න ඒ රැකියාවට අදාළ කාර්යය භාර්යය පිළිබඳව හඳුනා ගැනීම කලයුතුය

08. පවරනු ලබන කාර්යට අදාළව වැටුප් ලබා දෙන්නේද යන්න සහතික කර ගැනීම.

09. එම සම්බන්ධීකරණය හරහා රැකියා ගත වීමට තෝරාගන්නා ලද ආබාධ සහිත තැනැත්තන් පිළිබඳව මූලික තොරතුරු ආකෘති පත්‍ර 01 හරහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කල යුතුය.

10. ආබාධ සහිත තැනැත්තන් රැකියා ගත කිරීමට කැමැත්ත ප්‍රකාශිත ආයතනය පිළිබඳ ආයතනික තොරතුරු (ඇමුණුම අංක 03) මගින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත යොමුකල යුතුය.

11. රැකියා යෝජිත ආයතනය ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය සමඟ ගිවිසුම් පත්‍රය (ඇමුණුම් 02) හරහා මාස 24 ක කාල සීමාවකට ගිවිසුම් ගත විය යුතුය.

12. ගිවිසුම් ගතවූ පසු ඇමුණුම් 04 මඟින් තොරතුරු ලබාගෙන ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත එවිය යුතුයි.

13. රැකියා යෝජිත ආයතනය ආබාධ සහිත තැනැත්තන් සමඟ ඇතිකරගන්නා ගිවිසුම් පත්‍රයේ පිටපතක් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත යොමුකල යුතුය.

14. සෑම මසකම 15 දිනට පෙර පසුගිය මස වැටුප් වාර්තාව ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත එවීමට කටයුතු කලයුතු අතර එක් එක් අයට ලබාදෙනු ලබන වැටුප් සහනාධාරය එම ආයතනයට ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

15. රැකියාව හැරගියේ නම් ඒ බව ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත කඩිනමින් වාර්තා කිරීම.

16. අනිවාර්යෙන්ම ගිණුමක් විවෘත කර ආයතනය හෝ පුද්ගලයා විසින් රැකියා නියුක්තිකයාගේ වැටුප ගිණුමට බැරකල යුතුය.

17. රැකියා ගතකළ පසු අදාළ ආයතන වෙත ලබාදෙන මුදල් පිළිබඳ වාර්තාවක් එම මාසය තුළ ඔබගේ දැනගැනීම සඳහා ලබාදෙනු ඇත.

18. රැකියාලාභියාට සමාන වරප්‍රසාද ලබාදීම කල යුතුය.මෙම සේවකයන්ටද ආයතනයේ අනෙකුත් සේවකයන්ට මෙන් සමාන අවස්ථා දීමට ඔවුන් දැනුවත් කල යුතුය.

54

19. ආයතනය මගින් ලබාදෙන අනෙකුත් පහසුකම් පිළිබඳව සේවාලාභියා හා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය දැනුවත් කල යුතුය.

අධ්‍යක්ෂ
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය
පළමු මහල
සෙත්සිරිපාය II අදියර
බත්තරමුල්ල
දු.ක 011- 28 77 374

අශෝකා අලවත්ත
ලේකම්

පිටපත් :-

01. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
02. ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
03. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
04. සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරු - කරු.දැ.ගැ.ස
05. විගණකාධිපති - කරු.දැ.ගැ.ස
06. අධ්‍යක්ෂ ජෙනරාල්, අයවැය දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස
07. අධ්‍යක්ෂ, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස
08. සමාජ සේවා අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස
09. සියළුම පළාත් සමාජ සේවා අධ්‍යක්ෂකවරුන් - කරු.දැ.ගැ.ස
10. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස හා අ.ක.ස
11. ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස හා අ.ක.ස
12. සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ප්‍රධාන ගණකාධිකාරීන් - කරු.දැ.ගැ.ස හා අ.ක.ස
13. ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
14. සියළුම දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරීන් - කරු.දැ.ගැ.ස හා අ.ක.ස


| | | |
|---|---|---|
| අමාත්‍ය/அமைச்சர்/Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2861 145 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2884 613 |
| රාජ්‍ය අමාත්‍ය/இராஜாங்க அமைச்சர்/State Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2877 841 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2877 606 |
| නියෝජ්‍ය අමාත්‍ය/ பிரதி அமைச்சர்/Deputy Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2877 121 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2877 126 |
| ලේකම්/செயலாளர்/Secretary | දුරකථන /தொ.பே./Tel. : 011 - 2883 525 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2187 007 |
| අමාත්‍යාංශ කාර්යාලය /அலுவலகம்/General Office | දුරකථන /தொ.பே./Tel. : 011 - 2887 349-51 | ෆැක්ස්//பெக்ஸ்/Fax : 011 - 2877 127 |

අමාත්‍යාංශය | 1වන මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල.
அமைச்சு | 1ஆவது மாடி, செத்சிறிபாய கட்டம் II, பத்தரமுல்லை.
Ministry | 1st Floor, Sethsiripaya Stage II, Battaramulla.

විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/E-Mail : msesecretary@sltnet.lk
වෙබ් අඩවිය/இணையத்தளம்/Website: www.socialemwelfare.gov.lk